# මූලික පිරිවෙන් පළමුවාර පරීක්ෂණය - 2019

## 04 ශ්‍රේණිය / Grade 04

| | |
|---|---|
| ඉතිහාසය - I, II | කාලය : පැය තුනයි. |
| History - I, II | Time : 03Hours |

### ඉතිහාසය - I

**උපදෙස්**

- **මෙම කොටස ප්‍රශ්න 20 කින් සමන්විත වේ.**
- **එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා දී ඇති උපදෙස් අනුව පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් හිමිවේ.**

**01.** හයවන පරාක්‍රමබාහු රජු සමයේ සිටි ප්‍රකට පඬිවරයෙකු වන්නේ,

1. වැත්තැවේ හිමි  2. මේධංකර හිමි
3. කාශ්‍යප හිමි  4. පැපිලියානේ මංගල හිමි

**02.** හතරවන පරාක්‍රමබාහු රජු ඉදිකළ විහාරයක් වන්නේ,

1. දෙවුන්දර පටිමාඝරය  2. උත්තරාරාමය
3. ගඩලාදෙණිය  4. තිවංක පිළිමගෙය

**03.** දළදාව සහ පාත්‍ර ධාතුව ආක්‍රමණය කොට ඉන්දියාවට රැගෙන ගිය සෙන්පතියා කවරෙක්ද?

1. ජගත් විජය  2. තුන්වන කෘෂ්ණ
3. ආර්ය චක්‍රවර්තී  4. ලංකාපුර දේව

**04.** I බෙලිගල පර්වතය මුදුනේ දළදා මාළිගාවක් ඉදිකල රජු වන්නේ,

1. පළමු පරාක්‍රමබාහු රජු  2. තුන්වන විජයබාහු රජු
3. හතරවන විජයබාහු රජු  4. දෙවන පරාක්‍රමබාහු රජු

**05.** නිශ්ශංකමල්ල රජුගේ පුත්‍රයා මෙරට රජකම් කරන ලද්දේ දිනකට අඩු කාලයකි. ඔහුගේ නම වන්නේ,

1. ධර්මාශෝක  2. අනීකංග  3. සහාස්සමල්ල  4. වීරබාහු

**06.** පොළොන්නරු යුගයේ රට පාලනය කළ රාජවංශ දෙක වන්නේ,

1. කාලිංග - පාණ්ඩ්‍ය  2. මෞර්ය - පාණ්ඩ්‍ය
3. මෞර්ය - ලම්බකර්ණ  4. කාලිංග - ලම්බකර්ණ

**07.** දඹුලු විහාරයේ පිළිම හැත්තෑතුනක රන් ආලේප කළ රජු වන්නේ,

1. මහා විජයබාහු රජු  2. දුටුගැමුණු රජු
3. වසභ රජු  4. නිශ්ශංකමල්ල රජු

**08.** මහා පරාක්‍රමබාහු රජුගේ දෙමාපියන් වන්නේ,

1. ලෝකිතා - මොග්ගල්ලාන මහා සාමි  2. රත්නාවලී - මාණාභරණ
3. සුගලා - II මාණාභරණ  4. පාර්වතී - ශ්‍රී ජයගෝප

**09.** වංශ කතාව තුළ කොට්ඨ බද්ද, සූකර නිකර්නිජ්ඣර, දෝරදත්තික යනුවෙන් සඳහන් වන්නේ,

**1.** වැව් තුනක නම් වේ. **3.** දැදුරු ඔය හරහා ඉදිකළ අමුණු තුනකි.

**2.** වරායන් තුනක නම් වේ. **4.** අනුරාධපුරයේ පිහිටා ඇති වැව් තුනකි.

**10.** බුරුමයේ අනුරුද්ධ රජුගේ සහයෙන් භික්ෂූන් ගෙන්වා ගෙන මෙරට උපසම්පදාව පිහිට වූ රජු වන්නේ,

**1.** මහසෙන් රජු **2.** මහා විජයබාහු රජු

**3.** මහා පරාක්‍රමබාහු රජු **4.** හයවන පරාක්‍රමබාහු රජු

**11.** "රාජරාජ පෙරුම්පල්ලි" ලෙස හැඳින්වෙන්නේ,

**1.** චෝලයන් ඉදිකල බෞද්ධ විහාරයකි.

**2.** රාජ රාජ චෝල රජු ඉදිකල කෝවිලකි.

**3.** චෝලයන් අනුග්‍රය දැක්වූ බෞද්ධ විහාරයකි.

**4.** ඉහත පිළිතුරු කිසිවක් නොවේ.

**12.** පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ රැගෙන යාමට මෙරට ආක්‍රමණය කළ චෝල රජු වන්නේ,

**1.** පළමු පරන්තක රජු **2.** රාජ රාජ චෝල රජු

**3.** රාජේන්ද්‍ර චෝල රජු **4.** එළාර රජු

**13.** අනුරාධපුර යුගයේ අවසන් වැදගත් පාලකයා වන්නේ,

**1.** හතරවන මහින්ද රජු **2.** පස්වන මිහිඳු රජු

**3.** නිශ්ශංකමල්ල රජු **4.** ධාතුසේන රජු

**14.** මහා පරාක්‍රමබාහු රජුගේ බිසව වන්නේ,

**1.** කල්‍යාණවතී බිසව **2.** ලීලාවතී බිසව

**3.** අනුලා බිසව **4.** සුගලා බිසව

**15.** සොළී රට ආක්‍රමණය කොට මකුඩන් කෝට්ටය ඇතුළු ගම්වලින් බදු අය කළ රජු කවරෙක්ද?

**1.** හයවන පරාක්‍රමබාහු රජු **2.** මහා පරාක්‍රමබාහු රජු

**3.** හතරවන පරාක්‍රමබාහු රජු **4.** තුන්වන පරාක්‍රමබාහු රජු

**16.** දේශගවේෂණය කරමින් අසියාවට පැමිණි පළමු යුරෝපා ජාතිය වන්නේ,

**1.** ප්‍රංශ **2.** ඉංග්‍රීසි **3.** පෘතුග්‍රීසි **4.** ලන්දේසි

**17.** ලොරෙන්සෝද අල්මේදා ඇතුළු පිරිස ශ්‍රී ලංකාවේ කවර ස්ථානයකට පළමුව ගොඩබසින ලද්දේද?

**1.** කොළඹ වරාය **2.** ගාලු මුවදොර

**3.** ත්‍රිකුණාමලය වරාය **4.** ගාලු වරාය

**18.** පෘතුග්‍රීසින්ගෙන් "දොන් පිලිප්" ලෙස බෞතිස්ම ලබන ලද්දේ,

**1.** යමසිංහ බණ්ඩාර **2.** කොනප්පු බණ්ඩාර

**3.** වීරසුන්දර බණ්ඩාර **4.** කරලියද්දේ බණ්ඩාර

**19.** ද ලසර්දා ඇතුළු පෘතුග්‍රීසි හමුදාව අන්ත පරාජයකට පත්වූයේ කුමන සටනකින්ද?

**1.** රන්දෙනිවල සටන **2.** මුල්ලේරියා සටන

**3.** දන්තුරේ සටන **4.** බලන සටන

**20.** පෘතුග්‍රීසින් මෙරටට පැමිණෙන විට කෝට්ටේ රාජ්‍යයේ රජු වූයේ,

**1.** හයවන විජයබාහු රජු **2.** පළමු විමලසුරේන්ද්‍ර රජු

**3.** අටවන වීර පරාක්‍රමබාහු රජු **4.** හයවන පරාක්‍රමබාහු රජු

# මූලික පිරිවෙන් පළමුවාර පරීක්ෂණය - 2019

## 04 ශ්‍රේණිය / Grade 04

**ඉතිහාසය - I, II**
**History - I, II**

**ඉතිහාසය** - II

**උපදෙස්**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 60 ක් හිමිවේ.**

**01. (i)** ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කර නම් කරන්න.

**1.** ගාල්ල **2.** කොළඹ **3.** පොළොන්නරුව

**4.** දඹදෙණිය **5.** කෝට්ටේ **6.** යාපහුව **(ලකුණු** 1 × 6 = 6)

**(ii)** පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



**A** රූපය

**(අ)** මෙහි රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

**(ආ)** මෙය කවර රජු විසින් ඉදිකරන ලද්දේද?

**(ඉ)** මෙය හැඳින් වූ අතීත නම හා වර්තමාන නම දක්වන්න.

**(ලකුණු** 1 × 3 = 3)



**B** රූපය

**(අ)** මෙම රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

**(ආ)** මෙහි බලකොටුවක් පළමු වරට ඉදිකල තැනැත්තා කවරෙක්ද?

**(ඉ)** මෙහි පළමුවරට රාජධානියක් පිහිටුවාගත් රජු කවරෙක්ද?

**(ලකුණු** 1 × 3 = 3)

**02. (i)** අනුරාධපුර යුගයේ පළමු රජු හා අවසාන රජු නම් කරන්න.

**(ii)** අනුරාධපුර යුගයේ පරිහානියට බලපෑ හේතු 04 ක් නම් කරන්න.

**(iii)** අනුරාධපුර රාජධානිය බිඳවැටුණු ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**03. (i)** පොළොන්නරු රාජධානියේ රජකළ ශ්‍රේෂ්ඨතම පාලකයන් තිදෙනාගෙන් **දෙදෙනෙක්** නම් කරන්න.

**(ii)** චෝලයන් පොළොන්නරුව අගනුවර කර ගැනීමට බලපෑ හේතු **හතරක්** නම් කරන්න.

**(iii)** පළවන විජයබාහු රජුගේ ආර්ථික සේවා කරුණු **දෙකක්** මගින් පෙන්වා දෙන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**04. (i)** හයවන පරාක්‍රමබාහු රජුගේ කාලය පිළිබඳ හැදෑරිය හැකි මූලාශ්‍ර කෘති **දෙකක්** නම් කරන්න.

**(ii)** හයවන පරාක්‍රමබාහු රජු වැඩි දියුණු කල පූජනීය ස්ථාන **හතරක්** නම් කරන්න.

**(iii)** හයවන පරාක්‍රමබාහු රජුගේ සමයේ සාහිත්‍යයේ පැවැති දියුණුව කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**05. (i)** දහසය වන සියවස වන විට දේශපාලන වශයෙන් මෙරට බෙදී පැවැති කොටස් **තුන** නම් කරන්න.

**(ii)** ආසියාවේ බලය පිහිට වූ යුරෝපා ජාතීන් **හතර** නම් කරන්න.

**(iii)** විජයබා කොල්ලය යනු කුමක්දැයි පැහැදිලි කොට ඒ සමඟ කෝට්ටේ රාජ්‍යය බෙදී ගිය කොටස් **තුන** නම් කරන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**06. (i)** ශ්‍රී ලංකාවට පැමිණි පළමු පෘතුග්‍රීසි ජාතිකයා කවරෙක්ද?

**(ii)** යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීමෙන් බලාපොරොත්තු වූ අරමුණු මොනවාද?

**(iii)** පෘතුග්‍රීසින් පළමු වරට ශ්‍රී ලංකාවට පැමිණීම සිදු වූ ආකාරය විස්තර කරන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**07.** පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික තොරතුරු ලියන්න.

**i.** මහා පරාක්‍රමබාහු රජුගේ ආර්ථික සේවය

**ii.** කුරුණෑගල යුගයේ ආගමික අනුග්‍රහයන්

**iii.** කාලිංග මාඝ ආක්‍රමණය

**iv.** රජරට චෝල පාලනය

**(ලකුණු** 06 + 06 = 12)